# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,478 - 2006 දෙසැම්බර් 29 වැනි සිකුරාදා - 2006.12.29

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පලකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1634 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බිම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1634 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - රංගා කලායතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

නුගවෙල ශිෂ්‍යත්ව භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2006 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

ජාතික සවිය අධිකාරිය පනත් කෙටුම්පත 2006 නොවැම්බර් මස 17 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ජනවාරි මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 දෙසැම්බර් මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

එක්සත් රාජධානියේ ටීඩබ්ලිව් TW7 5BG වර්ක් ලන්ඩන් පාර, 148 හි තිරුණාවුකරසන් අසෝකානන්ද වන මා විසින් මඩකලපුව, බාර් පාර 70හි අනුලාදේවි රාජ්කුමාර් මහත්මිය වෙත පවරන ලද 1996.10.18 දින දරන ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලබන බව ශ්‍රී ලංකා ආණ්ඩුවටත් මහජනතාවටත් නිවේදනය කරනු ලබන අතර 2002 ජනවාරි මස 15 වන දින සිට ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වගනොකියන බවද ප්‍රකාශ කරමි.

2006 ඔක්තෝබර් 18 වැනි දින දී ය.

12-804

---

## ඇටර්නි බලකරය අවලංගු කිරීමයි

රත්මලානේ, ඕඩියල් හරස් පාරේ අංක 14/5 දරන ස්ථානයේ පදිංචි ලලනි ප්‍රියන්ති ගාල්ලගේ වන මම විදේශගත වීම නිමිති කොට ගෙන මාගේ ඇටෝර්නි බලකරු ලෙස ගල්කිස්ස ටෙම්ප්ලර්ස් පාරේ සත්තිස්සර මාවතේ අංක 9/6 දරන ස්ථානයේ පදිංචි නන්එදිරි නෝමන් මැග්ලින් වීරතුංග සේනානායක යන අය පත්කරමින් වර්ෂ 2003 ක් වූ දෙසැම්බර් මස 20 දිනැතිව ගල්කිස්සේ දී ප්‍රසිද්ධ නොතාරිස් සී. ඒ. ධර්මතිලක මහතා විසින් ලියා සහතික කරන ලද අංක 1036 දරන මා විසින් තනනු ලැබූ අටෝර්නි බලකරය මා විසින් මෙයින් අවලංගු කර අහෝසි කරන ලද බවත්, එනයින් නෝමන් මැග්ලින් වීරතුංග සේනානායක යන අයගේ පත්වීම මෙයින් අවලංගු වී අහෝසි වන බවත්, මෙතැන් පටන් එම අටෝර්නි බලකරය හෝ ඒ මගින් හෝ ඒ යටතේ තනනු ලැබූ වෙනත් අටෝර්නි බලකර මගින්, එකී නෝමන් මැග්ලින් වීරතුංග සේනානායක යන අය හෝ ඔහුගේ සේවක නියෝජිත ආදී කිසිවකු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් වලංගු සහ නෛතික නොවන බවත්, ඒ පිළිබඳව මා වගකීමට බැඳෙන්නේ නැති බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දී සිටිමි.

ලලනි ප්‍රියන්ති ගාල්ලගේ.

12-906

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

කොළඹ 5, නාරාහේන්පිට, නාවල පාරේ, අංක 133/2 හි පදිංචි සියාන ගපූර් වන මා විසින් කොලොන්නාව, මීතොටමුල්ල පාරේ, අංක 125 හි පදිංචි ජයසිංහ මුදලිගේ දොන් පර්සි මයිකල් යන අය මාගේ ඇටර්නි බලකරු ලෙස පත් කරමින්, ඔහු වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එච්. එම්. ඒ. අස්වි විසින් ලියා සහතික කරන ලද අංක 1123 හා 2005 ඔක්තෝබර් මස 14 දාතම දරන ඇටර්නි බලය වහාම ක්‍රියාත්මක වන පරිදි ප්‍රත්‍යාදිෂ්ට කොට, අහෝසි කොට අවලංගු කරන ලද බවත්, එකී ජයසිංහ මුලිගේ දොන් පර්සි මයිකල් තවදුරටත් මාගේ ඇටර්නි බලකරු වශයෙන් ක්‍රියා නොකරන බවත් මෙතැන් සිට ඔහු විසින් එළඹෙනු ලබන කවර හෝ ගණුදෙනුවකට මා වගකීම් භාරයක් නොදරන බවත් ශ්‍රී ලංකා ආණ්ඩුවටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

12-805

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-බදුල්ල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ 2007 ක් වූ ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, බදුල්ල මහ නගර සභා සීමාව තුළ වැලිකාමුල්ලේ පිහිටි අරාවේවත්ත පල්ලේවත්ත සහ පල්ලේවත්ත නමැති ඉඩමෙන් බෙදාවෙන් කරනු ලැබූ කොටසක් වන බලයලත් මානක එම්. ෆුවාඩ් ඉස්මයිල් විසින් සාදනු ලැබූ අංක 3900 සහ අංක 1992 අගෝස්තු මස 10 වැනි දිනැති පිඹුරෙහි දක්වා ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි සියළු දේත් සමග වේ. විශාලත්වය- පර්චස් 23.50

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. කෝදාගොඩ විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද, 1996.10.16 දින සහ අංක 673 සහ 1997.02.14 දින සහ අංක 686 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මුතුකරුපන් මනෝහරන් ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2004.01.02 දින රජයේ ගැසට් පත්‍රය සහ 2004.01.28 වැනි දින ඩේලිනිව්ස්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* :-විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

01. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක්ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක් (1% ක්ද,)
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5% ක්ද,)
04. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා (රු. 2,000),
05. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
06. සියලුම ප්‍රචාරක වියදම්ද,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව තැන්පත් කල යුතු වේ. ඉහත කී

පරිදි දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

තිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.ප්‍රධාන කළමනාකරු (අයකිරීම් දෙපාර්තමේන්තුව), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයාමාවත, කොළඹ 10. දුරකථන අංක : 011-2661815/2661816.

අයි. ඩබ්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 835, බෝමළුව පාර, වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081-2211025.

12-907/7

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-ගාල්ල ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩේවිඩ් විසින් සහතික කරන ලද්දාවූද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූද, 2002 ක් වූ මාර්තු මස 15 වැනි දින සහ 2003 ක් වූ ජූනි මස 19 වැනි දිනයන්හි සහ පිළිවෙලින් අංක 2080 සහ 2241 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නුවනදුන් තිලින පණ්ඩිතරත්න ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේදී 2007 ජනවාරි මස 12 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගාල්ල මහ නගර සභා සීමාව තුළ ගාල්ලේ මාඉටිපේ පිහිටි මිලිද්දුව මොරිස් පාරේ වරිපනම් අංක 85 හි කඩකුට්ටි වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඒ. ඩී. ඒ. ගුණසේකර විසින් 1997.12.10 වැනි දින මැන සාදන ලද අංක 1731ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් ඒ (ලොට් 1ඒ, 1 බී, 1 සී 2 සහ 1සී3 කැබලිවලින් ඒකාබද්ධ කළ) වලින් වෙන් කරන ලද ලොට් ඒ3 සහ 1731 දරන පිඹුරේ ලොට් ඒ6 මතින් මාර්ග අයිතියද සමග වේ. විශාලත්වය-පර්චස් 34.51

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.27 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.11.09 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* :-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

01. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක්ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක්ද,
04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500) ක් ද,
05. සියළුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (2000) ක්ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂණ සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, ගාල්ල ශාඛාව (දු. ක. අංක 091-5450008/091 - 2232248) හෝ කොළඹ 10 ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

12-886

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - අම්බලන්තොට ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූද, 1998 ක් වූ මාර්තු මස 24 වැනි දින අංක 861 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම වසන්ත ප්‍රියදර්ශන වර්ණසූරිය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේදී 2007 ජනවාරි මස 17 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ සුවාරපොල පිහිටි මොරටුව පාරේ වරිපනම් අංක 187/6 දරන "දෙල්ගහවත්ත" නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක එච්. එල්. ගුණසේකර විසින් 1996.05.30 දින මැන සාදන ලද අංක 6050 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 දරන ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි ආදී සියළු දේත් සමග වේ. විශාලත්වය-පර්චස් 6.10

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.13 දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.10.25 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* :-වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය

01. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක්ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක්ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක්ද,

04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500) ක් ද,
05. සියළුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස ක් (2000) ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවාඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අම්බලන්තොට ශාඛාව (දු. ක. අංක : 047-2225353/ 047-2223/69 හෝ කොළඹ 10 ටී. බී. ජයා මාවත, අංක 479 ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්) දුරකථන අංක : 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය,
කොළඹ 12.

12-885

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900000371.

ණයකරුගේ සම්පූර්ණ නම : විජේවීර ආරච්චිගේ ප්‍රශන්ත ප්‍රියලාල්

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.11.01 වැනි දින අංක 1261 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.11.02 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 22, ප්‍රනාන්දු ඇවනියු, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, මීගමුව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මයා විසින් 2007.01.18 වැනි දින ප. ව. 2.30ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ විසිනවදහස් හැටහයයි ශත අනූනවයක (රු. 2,29,066.99) මුදලක් වර්ෂ 2002.05.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑපන්දහස් නවසිය තිස්හයක (රු. 75,936) මුදල ද, 2002.05.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ පනස් තුන්දහස් එකසිය තිහයි ශත අනූනවයක (රු. 1,53,130.99) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ විසිනවදහස් හැටහයයි ශත අනූනවයක (රු. 2,29,066.99) ද,

(2) එකී රුපියල් හැත්තෑපන්දහස් නවසිය තිස්හයක (රු. 75,936) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොලියක් 2002.06.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, ඕතර පළාතේ, මාරවිල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ මොහොට්ටිමුල්ල හි පිහිටි ගුරුගොඩැල්ල නමැති ඉඩම 1985.06.29 දින ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් මැන සාදන ලද අංක 679 බී/85 දරන පිඹුර ප්‍රකාර අංක 1 දරන කැබැල්ලට මායිම්, උතුරට : රොබට් ප්‍රනාන්දුගේ ඉඩම ද, නැගෙනහිරට : එම ඉඩමේම ඉතිරි කොටසක් හා කැබලි අංක 2 දරන අඩි 8 ක් පළල පාර ද, දකුණට : ආර්. ඩී. සේදිරිස්ගේ ඉඩම ද, බටහිරට : ඔගස්තින් ලෝ ගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක (අ. 0, රූ. 1, පර්. 0) වපසරියකින් යුතු වූ ඉඩම. මීට අයත් මාර්ග පරවශතාවයන් සමග වේ. මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 38/59 හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 වූ දෙසැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

12-893

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900000858.

ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටි ආරච්චිගේ චන්ද්‍රාවතී

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2004.09.03 වැනි දින අංක 1357 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2004.09.14 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකරගැනීම පිණිස කෙසේවුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 22, ප්‍රනාන්දු ඇවනියු, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, මීගමුව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මයා විසින් 2007.01.17 වැනි දින පෙ. ව. 11.00ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස් හය දහස් හත්සිය අනූඩයි ශත තිස්හයක (රු. 1,56,790.36) මුදලක් වර්ෂ 2003.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ විසිඑක්දහස් නවසිය තුනයි ශත පනස්හයක (රු. 1,21,903.56) මුදල ද, 2003.08.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්හතර දහස් අටසිය අසූහයයි ශත අසූවක (රු. 34,886.80) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස්හය දහස් හත්සිය අනූවයි ශත තිස්හයක් (රු. 1,56,790.36) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ විසිඑක්දහස් නවසිය තුනයි ශත පනස්හයක (රු. 1,21,903.56) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොලියක් 2003.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ලියාපදිංචි කොට්ඨාසයේ කඩවත් කෝරලේ, කඩවත් සතරෙහි, පුත්තලම් පත්තුවේ, අට්ටවිල්ලුව ග්‍රාමයේ, අට්ටවිල්ලු කැලේ නමැති ඉඩම මිනුම්පති විසින් මැන සම්පාදිත අංක එෆ්. සී. පී. පුත් 14 පිඹුරෙහි ලොට් 108 ට මායිම්, උතුරට : ලොට් 107 ද, නැගෙනහිරට : ලොට් 106 ද, දකුණට : ලොට් 109 ද, බටහිරට : ලොට් 18 (පාර) ද යන මායිම් තුළ පිහිටි අක්කර පහයි රූඩ් එකයි පර්චස් තිස්තුනක් (අ. 5, රූ. 1, පර්. 33) විශාල ඉඩම ඒ තුළ පිහිටි සියළු දේ ද සමග පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 5/242 හි ලියාපදිංචි වී ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

12-894

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1900000908.

ණයකරුගේ සම්පූර්ණ නම : පේමසිරි නවරත්නයලාගේ රණසිංහ

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.11.08 වැනි දින අංක 1262 දරන *ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.11.08 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්", "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව, යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා පහත විස්තර කර තිබෙන දේපළ අංක 22, ප්‍රනාන්දු ඇවනියු, ඩයස් ගරාජ් ගොඩනැගිල්ල, මීගමුව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු වන ඩබ්. පී. සී. පෙරේරා මයා විසින් 2007.01.18 වැනි දින පෙ. ව. 10.30ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හැටහත්දහස් හත්සීයයි ශත දාහතයි (රු. 2,67,700.17) මුදලක් වර්ෂ 2002.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස්නවදහසක (රු. 1,39,000) මුදල ද, 2002.03.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ විසිඅටදහස් හත්සීයයි ශත දාහතක් (රු. 1,28,700.17) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හැටහත්දහස් හත්සීයයි ශත දාහතයි (රු. 2,67,700.17) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ තිස්නවදහසක (රු. 1,39,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.50% බැගින් වන පොලියක් 2002.04.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීම පිණිස,

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ලියාපදිංචි කොට්ඨාසයේ තට්ටැව ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ පණ්ඩිත පත්තුවේ, ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවේ, ආනමඩුව ග්‍රාමයේ පිහිටි 1983.12.12 දින සර්වේ ජනරාල් තැන මැන සැකසූ අංක එෆ්. වී. පී. 2 දරන පිඹුරේ කැබලි 181 ට මායිම්, උතුරට : වී. පී. 3508, නැගෙනහිරට : කැබලි 183 හි කොටසක්, දකුණට : කැබලි 180 සහ 192, බස්නාහිරට : කැබලි 180 යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහයයි දශම පහයි අටක (අ. 0, රූ. 1, පර්. 10.58) විශාල ඉඩම. මෙය සියළු දේ සමග පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඩී. 34/159 හි ලියාපදිංචි කරන ලදී.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2006 වූ දෙසැම්බර් මස 15 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

12-895

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-අම්පාර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ 2007 ක් වූ ජනවාරි මස 16 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, වැගම් පත්තුව-උතුර උප දිසාපති කොට්ඨාසයේ, අම්පාර නගර සභා සීමාව තුළ අම්පාර, කල්මුනේ පාරේ, දැනට වරිපනම් අංක 690 සහ 692 දරන සර්වේයර් ජනරාල්ගේ (මිනුම්පතිගේ) අංක 280009 සහ 1990 මාර්තු 05 වැනි දිනැති කැඩැස්තර සිතියම් පිඹුරේ

ලොට් 181 දරන කොටස පිළිබඳව ණයකරුට ඇති කවරාකාරයේ හෝ සම්පූර්ණ බදු අයිතිය, බුදල් අයිතිය, අයිතිවාසිකම, හිමිකම, සම්බන්ධතාවය, ප්‍රතිලාභය, හිමිකම් පෑම සහ ඉල්ලා සිටීම වේ. විශාලත්වය-හෙක්ටයාර් 0.03945

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. කුගතරන් විසින් සහතික කරන ලද්දාවූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 1997.09.24 වැනි දින සහ අංක 260 දරන බැඳුම්කරය සහ නින්තාවූර් ප්‍රසිද්ධ නොතාරිස් එස්. මුතුමීරන් විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමට ලියන ලද්දා වූ ද, 2002.08.23 වැනි දින සහ 2002.11.30 වැනි දින සහ පිළිවෙලින් අංක 4648 සහ 4842 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම "ෂිහාන් රයිස් මිල්" යන නාමය විලාශය සහ අභිධානය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යන අහමඩ් ලෙබ්බේ හරුන් ණයකරු හැටියට පැහැර හැර ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2006.10.13 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* සහ 2006.10.25 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය* :-විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

01. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ක් ද,
04. නොතාරිස්ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා (රු. 2,000),
05. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
06. සියලුම ප්‍රචාරක වියදම්,

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත තැන්පත් කළ යුතු වේ. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (අයකිරීම් දෙපාර්තමේන්තුව), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661815/2661816.

අයි. ඩබ්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081-2211025., 071-4213497, 071-4755974.

12-907/6

---

## සීමාසහිත සෙලාන් බැංකුව-පියස යුනිට් ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ඉතා වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වත්තල ප්‍රාදේශීය සභා හැඳල උපකාර්යාල සීමාව තුළ හැඳල ගමේ ශාන්ත මරියා පාරේ, වරිපනම් අංක 232 දරන (කොටසක්) ජාවාගේවත්ත නමැති ඉඩමෙන් බෙදූ ඒකාබද්ධ කැබලි දෙකක් (ලොට් 12-ලොට්14) සහ එහි තුළ පිහිටි සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 37.08 (ලොට් 12-පර්චස් 18.50, ලොට් 14-පර්චස් 18.58).

ඉහත සඳහන් ඉඩමේ ලොට් 27 සහ 29 දරන මාර්ග අයිතිය සහ වෙනත් අයිතීන් සමග මෙම දේපළ මට්ටක්කුලිය පදිංචි සේනාපතිගේ ජෝර්ජ් හෙඩ්වික් රුදිගු යන අය බන්ධනදායි වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක්වූ ජනවාරි මස 26 වැනි දින ප. ව. 2.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.12.09 දින රජයේ *ගැසට් පත්‍රය ද*, 2005.11.14 වැනි දින ලංකාදීප, ඩේලිමිරර් සහ 2005.11.25 වැනි දින වීරකේසරි යන පුවත්පත් බලන්න. එමෙන්ම විකිණීම පිළිබඳ දැනුම්දීම සඳහා 2005.12.09 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* බලන්න.

*ඉඩමට පිවිසීම* :-කොළඹ මීගමුව පාරේ වත්තල හන්දියෙන් හේකිත්ත පාරට හැරී පල්ලිය වත්ත පාලම දක්වා ගමන් කර වම් දෙසට හැරී පල්ලිය වත්ත පාරට පිවිස මීටර් 600 ක් පමණ ගමන් කර දකුණට ඇති මිනින්ද්‍රපුර පාරට හැරී ඉදිරියට මීටර් 600ක් පමණ ප්‍රීතිපුර නිවාසයට පෙර ඇති මාර්ග ප්‍රවේශයට ඇතුළු වී ස්වල්ප දුරක් ගියවිට මෙම පාරේ දකුණු දෙසින් පාරට මායිම්ව අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* :-විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

ගැණුම් මිලෙන් 10 (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයටඅනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුවේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකරු (නීති), සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 4701256, 011-2456258, 077-7736452.

අයි. ඩබ්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු,

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව,
මහනුවර.

දුරකථන අංක : 081-2211025. 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් අංක : 081-2211025.

12-882/2

---

## ඩී එෆ් සී සී බැංකුව - මොණරාගල

### (කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විකිණීමයි

ඌව පළාත, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ, බුත්තල වැදිරට කෝරළේහි, මුප්පනේ එගොඩවත්ත යනුවෙන් හඳුන්වනු ලබන

මිනින්දෝරු ඩබ්ලිව්. විල්මට් සිල්වා මහතා විසින් සහතික කරන ලද ප්ලෑන් අංක 730 දරන 1995 ඔක්තෝබර් මස 15 වන දින ඇපකරය යටතේ ගෙවීම් සිදුවී නොමැත. ඩී. එෆ්. සී. සී. බැංකුව විසින් අප වෙත පවරන ලද බලතල අනුව ලොට් අංක 13ඩී යනුවෙන් නිරූපිත ඉඩම් කොටස. ඉඩම ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්චස් 13.90 එහි පිහිටි සියලුම දේ සමග. මොණරාගල පදිංචි දිසානායක මුදියන්සේලාගේ පුබුදු සමරසේකර විසින් ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලද ණය අංක 10114 දරන 2004 මාර්තු 09 වන දින බදුල්ල සුප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද මහතා විසින් සහතික කළ, 2007 ජනවාරි මස 18 වන බ්‍රහස්පතින්දා පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය* : මිල තීන්දු වනවාත් සමගම, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් වටිනාකම් මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10%ක්
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන විකුණුම් බදු
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක් පමණයි)
4. රු. 17,700.00 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැයෙන් 50%ක්.
5. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 500 යි
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000 යි.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් අධිකාරියක් මගින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අය බදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද, සමග අදාල පරිදි වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඩී. එෆ්. සී. සී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව වෙතින් විමසන්න. දුරකථන අංක : 011-2440366.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ පිළිගත් පුරෝගාමී, වරලත් වෙන්දේසිකරුවෝ
සහ තක්සේරුකරුවෝ.

| *ප්‍රධාන කාර්යාලය* : | *නගර කාර්යාලය* : |
|---|---|
| 24, ටොරින්ටන් පාර, මහනුවර | 290, හැව්ලොක් පාර, කොළඹ 05 |
| දුරකථන අංක : 081-2227593 | දුරකථන අංක : 011 2502680, 2585408 |
| දුරකථන/ෆැක්ස් අංක : 081-2224371 | දුරකථන/ෆැක්ස් අංක : 011 2588176 |
| | ඊ-මේල් : samera@sri.lanka.net |

12-846

---

## මහජන බැංකුව - කල්පිටිය ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයට අයත් කල්පිටිය මුසල්පිටිය ගමේ පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. සංකර ලිංගම් මහතා විසින් 1998.08.19 වැනි දින මැන සාදන ලද අංක 2973 දරන පිඹුරේ සඳහන්, අක්කර 02 ක් විශාල ඉඩම සහ කල්පිටිය මුසල්පිටිය ගම පිහිටි ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. සංකර ලිංගම් මහතා විසින් 1998.08.19 දින මැන සාදන ලද අංක 2974 දරන පිඹුරේ සඳහන් අක්කර 02 ක් විශාල ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.01.16 දින පෙ.ව. 11.00 ට, දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.*– රජයේ ගැසට් පත්‍රයේ 2005.12.16 වැනි දින ද, දිනමිණ පුවත්පතේ 2005.12.08 වැනි දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2005.12.09 වැනි දින ද, තිනකරන් පුවත්පතේ 2005.12.08 වැනි දින ද පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– කල්පිටිය සිට කි. මී. 06 ක් පමණ දුර ගිය පසු හමුවන පල්ලිවාසල් තුරේ හන්දියෙන් පවුසි මාවතේ කි. මී. 1 1/2ක් පමණ දුරගිය පසු හමුවන මුස්ලිම් මහ විදුහල මාර්ගයේ සැතපුම් 1/4ක් පමණ දුරින් පිහිටි මුසල්පිටිය ග්‍රාමයේ සරුසාර ලුණු වගාව සහිත අක්කර 04 ක් විශාල ඉඩම හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10%
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු
7. ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, ෆැක්ස් අංක : 032-2255247, 032-2253300

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවිවොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර, මීගමුව.
දුරකථන අංක : 031-2223219

12-811/1

---

## මහජන බැංකුව - මීගමුව ශාඛාව

### 1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

කල්පිටිය, උසිලන්තිවු ග්‍රාමයේ පිහිටි පුලසව්කානි හෙවත් සින්නකට්ටිවඩිකානි නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. සංකරලිංගම් මහතා විසින් 1995 මැයි මස 07 වන දින මැන සාදන ලද අංක 1731 දරන පිඹුරේ සඳහන් අක්කර 01, රූඩ් 02, පර්. 27.5 ක් විශාල ඉඩම මහජන බැංකුව විසින් මා වෙත පවරා ඇති බලය මත 2007 ජනවාරි මස 16 දින පෙ.ව. 1.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.*– 2005 දෙසැම්බර් මස 16 වන දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2005 දෙසැම්බර් මස 09 දින ඩේලිනිව්ස් පුවත්පත සහ 2005 දෙසැම්බර් 08 දින දිනමිණ පුවත්පතද බලන්න. 2005 දෙසැම්බර් 08 තිනකරන් පුවත්පතේද පළ කර ඇත.

*දේපළට පිවිසීම.*– පුත්තලම, කල්පිටිය මාර්ගයේ නව පවුසි මාවතේ මුසල්පිටිය දක්වා ගමන්කර, මුසල්පිටිය නව මුස්ලිම් දේවස්ථානය පසුකර යාර 100 ක් පමණ දුර ගිය පසු වම් පැත්තට ඇති අතුරු මාර්ගය අවසානයේ පිහිටි ලුණු ලේවායද පසුකර ඉදිරියෙන් නැවත වම් අත දෙසට හැරී ගියපසු පොල් වගා කර ඇති ඉඩම් යාය මායිම් දිගට ඇති වැලි සහිත මාර්ගයේ යාර 300 ක් පමණ ගියපසු පලියඩිකාන නැමැති මෙම ඉඩම හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැනුම් මිලෙන් 10%,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 032-2253301, ෆැක්ස් අංක 032-2255247. හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙව්වොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර - මීගමුව.
දුරකථන අංක : 031-2223219/2277518

12-811/2

---

## මහජන බැංකුව - මීගමුව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**මීගමුව, ගිරිඋල්ල පාරේ, තලගොල්ල අකරගම පිහිටි ගොඩනැගිල්ලක් සහිත වටිනා දේපළ විශාලත්වය : අක්කර 0, රූඩ් 02, පර්චස් 26**

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007 ජනවාරි මස 19 දින පෙ.ව. 10.30 ට, දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*වැඩි විස්තර සඳහා.*– රජයේ ගැසට් පත්‍රයේ 2002.07.19 දින ද, දිනමිණ පුවත්පතේ 2002.07.05 දිනද, තිනකරන් පුවත්පතේ 2002.07.05 දිනද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*–මීගමුව ගිරිඋල්ල පාරේ මීගමුව සිට ගිරිඋල්ල දෙසට සැතපුම් 12 ක් පමණ ගියවිට පාරේ වම්පස තලගොල්ල අකරගම ග්‍රාමයේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය :

1. ගැනුම් මිලෙන් 10%,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, ෆැක්ස් අංක : 032-2255247/032-2253300

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර - මීගමුව.
දුරකථන අංක : 031-2223219

12-811/3

---

## මහජන බැංකුව - හලාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

**හලාවත මැදවත්ත - වැලිහේන පිහිටි, විශාලත්වය : හෙක්ටයාර් 0.146**

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2007.01.29 දින පෙ.ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

රජයේ *ගැසට් පත්‍රයේ* 2006.10.27 දින ද, දිනමිණ පුවත්පතේ 2006.10.09 දින ද, ඩේලිනිව්ස් පුවත්පතේ 2006.10.09 දින ද, තිනකරන් පුවත්පතේ 2006.10.09 දින ද පලකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*– හලාවත නගරයේ සිට මාළු වෙළඳපොල දක්වා ගොස් එතැනින් අඹකඳවිල පාරේ මැදවත්ත දක්වා යනවිට හමුවන පල්ලිය පසුකළ විට වම් අතට ඇති හතරවන අතුරු මාර්ගයේ ඉදිරියට යනවිට මෙම දේපළ හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැනුම් මිලෙන් 10%,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පලාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,

4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,
7. ගැනුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුලත නාත්තන්ඩියේ පිහිටි මහජන බැංකුව, හලාවත ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක : 032-2253301, ෆැක්ස් අංක : 032-2255247/032-2253300

තිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි ඉතිරි මුදල් දින 30 ක් ඇතුලත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්. පී. සී. පෙරේරා,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු හා
උසාවි කොමසාරිස්.

අංක 22, ප්‍රනාන්දු පාර - මීගමුව.
දුරකථන අංක : 031-2223219

12-811/4

---

## සී/ස සෙලාන් බැංකුව - පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ වෙන්දේසියේ විකිණීම

### පදිංචියට සුදුසු දේපලක්

*පානදුර වෑකඩ ගමේ පිහිටි 'කිරිපෙල්ලගහවත්ත' නැමැති ඉඩමෙන් බෙදා වෙන්කළ කොටසක් හා එහි තුල පිහිටි නිවස ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 14.62*

මෙම දේපල පානදුර වික්‍රමකරාල ආරච්චිගේ මහේන්ද්‍ර විජේසිරි, වික්‍රමකරාල ආරච්චිගේ සුමනපාල ප්‍රනාන්දු සහ කෝදාගොඩ රණසිංහගේ ඇඩ්ලින්, යන අය බන්ධනදායින් වශයෙන් සී/ස සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙත් වෙන්ව බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007ක් වූ ජනවාරි මස 26 වන දින පෙ. ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.02.24 වන දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2006.01.12 වන දින ඩේලිමිරර්, ලංකාදීප සහ වීරකේසරී යන පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– පානදුර ඔරලෝසු කණුව අසල සිට හොරණ පාරේ කි. මී. 01ක් පමණ ලංගම ඩිපෝව දක්වා ගමන් ගත්විට කවිරාජ මාවත හමු වේ. මෙම මාවත පසුකර ඉදිරියට මීටර් 200ක් පමණ ගමන්ගත් විට වම් දෙසින් පිහිටි 1 වන පටුමගට ඇතුළු වී මීටර් 150ක් පමණ ගමන් කළ විට මෙම පාරේ දකුණු දෙසින් දේපලට පිවිසෙන අඩි 10 ක මාර්ග ප්‍රවේශය හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සී/ස සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.

ප්‍රධාන කළමණාකරු (නීති),
සී/ස සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල,
අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011-2456258, 077-7736452

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර
දුරකථන අංක : 081-2211025, 071-4755974, 071-4213497, 071-2755974
ෆැක්ස් : 081-2211025

12-882/1

---

## මහනුවර දිසා අධිකරණයේ දී ය

### පිස්කල් විසින් කරනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියක්

කොළඹ 01, බ්‍රිස්ටල් වීදිය, අංක 21 දරන ස්ථානයේ තම ලියාපදිංචි කාර්යාලය වශයෙන් පවත්වාගෙන යන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්.

............*පැමිණිලිකාර සමාගම.*

*එදිරිව*

*නඩු අංකය* : <u>එම්බී/6040</u>
131/2003

1. මහනුවර, පේරාදෙණිය පාරේ, අංක 89/6 හි පදිංචි හජිරින් රාෂික් ෆාරිඩ්.

2. මහනුවර, අස්ගිරිය, ධම්මසිද්ධි මාවතේ, අංක 45, හි පදිංචි ශ්‍රියන්ති උදේනි දන්ගේ.

..................*විත්තිකරුවන්.*

වර්ෂ 2000 ඔක්තෝබර් මස 17 වන දින සමථ තීන්දුව ප්‍රකාර විත්තිකරු විසින් මුදල් ගෙවීම පැහැර හරින ලද බැවින් පැමිණිලිකාර බැංකුව හා විත්තිකරුවන් අතර ඇති වූ සමථය මත කිසිදු මුදලක් නොගෙවා පැහැර හැර ඇති බැවින් රුපියල් 1,080,000.00 ක මුදලක් සහ නෛතික පොලිය ද, ඔප්පුව මත අයවිය යුතු මුදලත්, පොලියක් ද, නඩු ගාස්තුද, ඇස්කිසි ගාස්තුද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක්, (වේනම්) එම මුදල අඩුකර අයකර

ගැනීම සඳහා විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුව වෙත උකස් කර ඇති පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල, 2007 ක් වූ ජනවාරි මස 22 වැනි දින ප. ව. 2.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සහා සීමාව තුළ අරුප්පල පිහිටි මුඩාදෙනිය කුඹුර නම් වූ ඉඩම සඳහා වර්ෂ 1991.01.29 වැනි දින සී. දූල්වල අවසරලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1988 දරන පිඹුරේ ප්‍රකාර කැබලි අංක 1 උතුරු නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණු නැගෙනහිරට : අරුප්පල සිට වතුපාර දක්වා වූ පාර දකුණු බස්නාහිරට : කේ. ජී. අප්පුහාමි සහ තවත් අයට අයිති දෙහිදෙනියලාගේ කුඹුර උතුරු බස්නාහිරට : එම්. ජී. ජෝතිසේනට අයිති වරිපනම් අංක 21/17 දරන දේපල සහ ඒ. එස්. උපතිස්සට අයිති වරිපනම් අංක 21/18 දේපල මායිම් වූ පර්චස් දහනවයයි දශම දෙකයි පහක් වපසරිය ඇති ඉඩම සහ එහි පිහිටි සැම සියලු දේද වේ. මෙකී දේපල මහනුවර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ 236/38 හි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නි. පිස්කල්,
දිසා අධිකරණය,
මහනුවර.

2006 ක් වූ දෙසැම්බර් මස 14 වැනි දින,
මහනුවර දී ය.

12-883/1

---

## පිස්කල් විකිණීම

මහනුවර දිසා අධිකරණයේ දී ය

කොළඹ 01 යෝක් ස්ට්‍රීට් හි ඕස්ට්‍රේලියා බිල්ඩිංහි ප්‍රධාන කාර්යාලය වශයෙන් පවත්වාගෙන යන සීමාසහිත ක්‍රිෂ්ණා මයිනින්ගේ (සිලෝන්) සමාගම
එදිරිව

නඩු අංකය එම්බී 6151

............*පැමිණිලිකරු*

කොළඹ 01 යෝක් ස්ට්‍රීට් හි ඕස්ට්‍රේලියා බිල්ඩිංහි අංක 54-2/5 දරන ස්ථානයේ ප්‍රධාන ලියාපදිංචි කාර්යාලයක් වශයෙන් පවත්වාගෙන යන සීමාසහිත ගෝල්ඩන් සිනෝ ටෙක්නොලජි ඩිවලොප්මන්ට් කම්පැණි (පුද්ගලික) සමාගම

............*විත්තිකරු*

වර්ෂ 2003 ක් වූ ඔක්තෝම්බර් මස 31 වැනි දින ඇති තීන්දු ප්‍රකාශය ප්‍රකාර විත්තිකාර සමාගම විසින් පැමිණිලිකාර සමාගමට රුපියල් 104,000,000 ක මුදලක් සහ එකී මුදල මත වර්ෂ 2002.11.04 වැනි දින සිට තීන්දුවේ දින 2003.10.31 වැනි දින දක්වා මසකට රුපියල් 40,000,000.00 බැගින් පොලියක් ද ඉන්පසු මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොලිය ද අයවිය යුතු බැවින් වසන් වනතුරු නෛතික පොලියක් ද, ගෙවා ඇති යම් මුදලක් වේ නම් එය අඩුකොට ඉහත කී විත්තිකරුගෙන් අයකර ගැනීම සඳහා පැමිණිලිකාර සමාගම වෙත උකස් කර ඇති පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල, 2007 ක් වූ ජනවාරි මස 19 වැනි දින ප. ව. 2.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

1. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ගන්දහය කෝරළේ, උතුරු කිරිමැටියේ පිහිටි අම්බලමාන එස්ටේට් නම් වූ ඉඩම සඳහා එස්. රංචිගොඩ අවසරලත් මිනින්දෝරු තැන විසින් වර්ෂ 1994 ක් වූ දෙසැම්බර් මස 28 වැනි දින මැන සාදන ලද අංක 1252 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 01 (එල්ආර්සී කෝ 205මහ/01මහ/198 මහ 206 මහ/03 මහ/199 මහ/06) දරන කොටස වන උතුරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයිති මෙම ඉඩමේ කොටසක් ද; නැගෙනහිරට : වතුපාර ද; දකුණට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අත්පත් කර ගත් මෙම ඉඩමේ ඉතිරි කොටස ද සහ බස්නාහිරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අත්පත් කර ගන්නා ලද මෙම ඉඩමේ ඉතිරි කොටස ද; මායිම් ද අක්කර දෙකක්, විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 301/16 දරන පොත් පිටුවේ ලියාපදිංචි කර ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිසාවේ, පාතහේවාහැට ගන්දහය කෝරළේ, උතුරු කිරිමැටියේ පිහිටි අම්බලමාන එස්ටේට් නම් වූ ඉඩම සඳහා එස්. රංචිගොඩ අවසරලත් මිනින්දෝරු තැන විසින් සාදන ලද අංක 1543 සහ 1986.06.17 වැනි දින දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කල කැබලි අංක 01 දරන උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද; නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසක් ද; දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටසක් ද; සහ බස්නාහිරට : වතුපාර ද මායිම් වූ අක්කර තුනක් විශාල ඉඩම සහ එහි පිහිටි සැම සියලු දේද සමග ඉහත කී වතුපාරේ ගමන් කිරීම සඳහා වෙනත් පොදු පරවශ්‍යතා අයිතින් සපුරා ගැනීමේ පොදු අයිතිය ද සමග වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී. 304/54 දරන පොත් පිටුවේ ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නි. පිස්කල්,
දිසා අධිකරණය,
මහනුවර.

2006 ක් වූ දෙසැම්බර් මස 12 වැනි දින දී ය.

12-883/2

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.